# අටුවා, ටීකා හා අර්ථකථන

බිංදුව ගැන සඳහන්කිරීමේ දී අපි අනන්තය ගැන ද කීවෙමු. එහෙත් අනන්තය යන්න සාමාන්‍යයෙන් අප සංඛ්‍යාවක් ලෙස හඳුන්වන්නක් සමග ඒ ආකාරයෙන් සංසන්දනයකිරීම සුදුසු නො වෙයි. බටහිර ගණිතයෙහි අනන්තය යන්න විවිධ ආකාරවලින් අර්ථදැක්වී ඇත. අප අනන්තය ගැන සඳහන්කෙළේ හුදෙක් බිංදුවේ ඇතැම් ගුණ තේරුම්ගැනීම සඳහා පමණකි.

මෙහි දී බිංදුව හා අනන්තය පිළිබඳ තවත් බොහෝ කරුණු කීමට ඇතත් ඒ සියල්ල සඳහන්කිරීමට අවස්ථාවක් නැත. බිංදුව යන්න තාත්ත්වික සංඛ්‍යා නමින් හැඳින්වෙන සංඛ්‍යාවල පමණක් නොව සංකීර්ණ සංඛ්‍යා සහ වෙනත් සංඛ්‍යාවල ද කියැවෙයි. බිංදුවෙන් සංඛ්‍යාවක් ගුණකළ හැකිවුවත් සංඛ්‍යාවක් බෙදිය නො හැකි ය. ඇතැම්හු සංඛ්‍යාවක් බිංදුවෙන් බෙදූවිට ලැබෙන්නේ අනන්තය යැයි කියති. එහෙත් ඒ නිවැරදි නො වෙයි. බටහිර ගණිතයෙහි දී බිංදුවෙන් බෙදීම අර්ථදක්වනු නො ලැබෙයි. එයට හේතුවක් ලෙස දැක්විය හැක්කේ බිංදුව යම් සංඛ්‍යාවකින් ගුණකළ විට එක වන්නේ ද යන ප්‍රශ්නය ඇසූවිට එයට පිළිතුරක් ලෙස සංඛ්‍යාවක් සොයාගැනීමට නො හැකිවීම ය. බිංදුව ඕනැම සාමාන්‍ය සංඛ්‍යාවකින් ගුණකළ විට පිළිතුර ලෙස බිංදුව ලැබෙයි.

අප සාකච්ඡාකරමින් සිටියේ නාගර්ජුනපාදයන් වහන්සේගේ ශූන්‍යතාවය පිළිබඳව ය. ශූන්‍යතාව, ශූන්‍යත්වය ආදිය නිවැරදි නොවුව ද, ලෝකය ශූන්‍ය වේ යන්න බුදු දහමට එකඟ ය. සියළු සංස්කාර අනිත්‍ය, දුක්ඛ, අනාත්ම මෙන් ම ශූන්‍ය බව ද බුදුන්වහන්සේ දේශනාකර ඇත. මෙය තවදුරටත් සාකච්ඡා කළයුතු යැයි අදහස් කරමි. එයට හේතුව අපට අවශ්‍යවන්නේ අපේ සංස්කෘතියෙහි ප්‍රවාද නිර්මානයකිරීමට බැවින් අපේ සංස්කෘතික පදනමෙහි ඇති මූලික කරුණු ගැන මනා වැටහීමක් අවශ්‍යවීම ය.

අපට මෙහි දී ඉතා වැදගත් ප්‍රශ්නයකට මුහුණදීමට සිදුවෙයි. ඒ, බුදුන්වහන්සේ දෙසූ බුද්දහම කුමක් දැයි අප දැනගන්නේ කෙසේ ද යන්න ය. ඒ දහම ඇත්තේ කොතැනක ද? ථෙරවාදී බෞද්ධයන් ලෙස අපේ පිළිගැනීම ඒ දහම ථෙරවාදී ග්‍රන්ථවල ඇති බව ය. එහෙත් උගත්තු ඉන් සෑහීමකට නො පත්වෙති. එයට හේතුව ථෙරවාදී ත්‍රිපිටකයෙහි ද ඇතැම් කරුණු පසුකාලීන ව එකතු වී ඇතැයි යන පිළිගැනීම ය. ත්‍රිපිටකයෙහි ද එසේ පසුකාලීනව එකතු වූ කරුණු ඇත්නම් අටුවා ටීකා ආදිය ගැන කියනුම කවරේ ද?

බුද්දහමට ලියන ලද විවිධ අටුවා වෙයි. සිංහල අටුවා යනු ඉන් සමහරකි. ආන්ද්‍ර දේශයෙහි ලියූ අටුවා ආදී වශයෙන් තවත් අටුවා වෙයි. පැහැදිලිව ම අටුවා යනු පසුකාලීන භික්ෂුන්වහන්සේ හා වෙනත් අය විසින් ලියන ලද කෘති වෙයි. අටුවාවලින් මූලිකව ම කෙරෙන්නේ බුද්දහමෙහි දුරාවබෝධ කරුණු සාමාන්‍ය ජනයාට තේරුම්ගත හැකි අයුරින් විස්තරකිරීම ය. එසේ තේරුම්කර දෙන්නේ බුද්දහම මුල්ග්‍රන්ථ ඇසුරෙන් තේරුම්ගත් අය ය. නිවැරදිව කිවහොත් එසේ තේරුම්ගත්තේ යැයි පිළිගැනෙන අය ය.

අටුවාවෙහි සඳහන් දෙය ද අවබෝධකරගැනීම අපහසු වූ විට ඒ තේරුම්කරදීම සඳහා අපේ සාහිත්‍යයෙහි ටීකා ලියැවී ඇත. ටීකාව ද තේරුම්ගැනීම අපහසු වූ විට ටිප්පණි ලියැවිණි. අටුවා, ටීකා, ටිප්පණි ආදියෙහි ඇතුළත්වන්නේ විවිධ අය විසින් ලියන ලද කරුණු ය. ඒ එකක්වත් බුදුන්වහන්සේ දෙසූ දහම ඒ අයුරෙන් ම පැවසීමක් නො වෙයි. දැන් ප්‍රශ්නය වන්නේ අටුවා, ටීකා ටිප්පණි ආදියෙහි සහ තවත් අප සම්මතයෙන් පිළිගන්නා කෘතිවල අඩංගු කරුණු ඒ ආකාරයෙන් ම පිළිගත යුතු ද යන්න ය.

අටුවාචාරීන් වහන්සේ යනු ද පෘථග්ජන වූහ. උන්වහන්සේ අතින් ද වැරදි සිදුවිය හැකි ය. උන්වහන්සේ බුද්දහම අනෙක් අයට තේරුම්කරදීම සඳහා කෘති නිෂ්පාදනය කළහ. එහෙත් උන්වහන්සේ බුද්දහම නිවැරදිව තේරුම්ගත්තේ ද, එසේත් නැතහොත් යම් ගැටළු තැනක් විස්තරකිරීමේ දී උන්වහන්සේ තමන්වහන්සේගේ අර්ථකථනවලට මූලික තැනක් දුන්නේ ද? ඒ අර්ථකථන කෙතරම් දුරට බුදුන්වහන්සේ දෙසූ දහම සමග එකඟවන්නේ ද?

© Prof. Nalin De Silva

මෙලෙස ප්‍රශ්නකිරීම ඇතැමුන්ට ගැටළුවක් වනු නො අනුමාන ය. අටුවා, ටීකා, ටිප්පණි ආදිය බුද්ධවචනය ලෙස පිළිගැනීමට ඇතැම්හු සූදානමින් සිටිති. එහෙත් අප එසේ නො කළයුතු ය. ත්‍රිපිටකයෙහි පවා බුද්ධවචනය ලෙස සැලකිය නොහැකි තැන් ඇත් නම් අටුවාවෙහි, ටීකාවෙහි හා ටිප්පණියෙහි එවැනි තැන් කෙසේ තිබිය නො හැකි ද? අප මෙයින් සඳහන්කරන්නේ අටුවා ටීකා ආදියෙහි අඩංගු කරුණු අප විචාරශීලීව හැදෑරිය යුතු බව ය. එහි ඇති ඇතැම් දෑ මුල් බුදුදහම සමග එකඟ නොවන්නේ නම් ඒ බව කීමට අප නො මැළිවිය යුතු ය. විචාරශීලී වීම බෞද්ධයනට පටහැණි කරුණක් නො වෙයි.

එහෙත් මෙහි දී වැදගත් ප්‍රශ්නයකට මුහුණදීමට අපට සිදුවෙයි. එනම් මුල් බුදුදහම යනු කුමක් දැයි අප දැනගන්නේ කෙසේ ද යන්න ය. අපි සිල්ලෝ ම පෘථග්ජනයෝ වෙමු. බුදුන්වහන්සේ ගේ මුල් බුදුදහම අප හැඳිනගන්නේ කෙසේ ද? ඒ සඳහා විවිධ ක්‍රම ඇතැයි අපි සිතමු. එහෙත් එහි දී විවිධ බාධා ඇතිවෙයි. අද අප සතුව ඇති පාලි ත්‍රිපිටකය බුදුන්වහන්සේ වදාළ වචනවලින් ම ඒ භාෂාවෙන් ම ලියැවී නැත. පාලි ත්‍රිපිටකය ඒ භාෂාවට පරිවර්තනයකිරීමට පෙර සිංහල භාෂාවෙන් පැවතිණි.

මෙයින් කියැවෙන්නේ අපට මුල් බුදුදහම දැනගැනීමට නොහැකි බව නො වෙයි. බුදුදහම ලෝකයේ ඇති අනෙක් දහම් සියල්ලෙන් ම වෙන්වන්නේ අනාත්ම හේතුකොටගෙන ය. කිසියම් වූ අර්ථකථනයක ආත්මවාදය ගැබ්වේ නම් අපට ඒ අර්ථකථනය කිසිම පැකිලීමකින් තොරව ප්‍රතික්ෂේප කළ හැකි ය. එහෙත් එසේ ප්‍රතික්ෂේපකිරීමට පෙර අදාළ අර්ථකථනය ආත්මවාදී බව සැකයකින් තොරව පෙන්වාදිය යුතු ය. යම් අර්ථකථනයක් අටුවාවට පටහැණි යැයි කීම හෝ ඒ අර්ථකථනය ආත්මවදී යැයි සාධක නැතිව ප්‍රකාශකිරීම හෝ එහි දී ප්‍රමාණවත් නො වෙයි. යම් අර්ථකථනයක් ආත්මවාදී යැයි පෙන්වාදීමේ දී ආත්මවාදය යනුවෙන් තමන් අදහස්කරන්නේ කුමක් දැයි පැහැදිලිකර එයට අනුව අර්ථකථනය ආත්මවාදී වන ආකාරය විස්තර කළයුතු ය.

මේ අතර මුල් බුදුදහමට හිමි අභ්‍යන්තර න්‍යායක් (logic) වෙයි. ඒ න්‍යාය සමග යම් අර්කථනයක් සංගත වේ දැයි පිරික්සිය හැකි ය. එහෙත් එහි දී ප්‍රශ්නය වනුයේ මුල් බුදුදහමෙහි අභ්‍යන්තර න්‍යාය කුමක් දැයි පැහැදිලි කරගැනීම ය. බුදුදහම හේතුවාදයක් (rationalism) නො වෙයි. ඒ පටිච්චසමුප්පන්න වෙයි. මේ පටිච්චසමුප්පාදය කුමක් සඳහා ද? ඒ සසර සැරිසරන සත්ත්වයකු පිළිබඳ ව ද? පටිච්චසමුප්පාදය සසරෙහි පෙර අත්බවක සිට ඉන් චුත වී වෙනත් අත්බවක පිළිසිඳ ගන්නා සත්වයකු පිළිබඳ කතා පුවතක් ද? අටුවාව මේ සම්බන්ධයෙන් කියන දේ ආත්මවාදී වන්නේ ද? සත්ත්වයකු පිලිබඳ සංකලපයක් ඇතිකරගැනීමේ දී ම ආත්මවාදී වන්නේ ද?

අපේ සංස්කෘතියෙහි ඇති අටුවා, ටීකා ටිප්පණි ආදිය සකස්කළ ආචාර්යවරුන්වහන්සේ හා අනෙක් පුද්ගලයන් ඉතාමත් නිර්මානශීලී වූ බවට සැකයක් නැත. අපේ ප්‍රවාද නිර්මානයකිරීමේ දී අප විසින් අටුවා ටීකා ආදියෙහි කුමක් තිබුණ ද එහි ආකල්පය ගුරුකොට ගතයුතු වෙයි. අටුවා ටීකා ආදියෙහි ඇත්තේ ඒ සම්පාදනය කළ අවධියෙහි නිර්මානය කෙරුණු නව අර්ථකථන ය. ඒ අර්ථකථන සිංහල බෞද්ධ සංස්කෘතියක නිර්මානය වූ දෑ ය. ඒ අර්ථකථනවලින් යම් ප්‍රමාණයක් මුල් බුදුදහමින් බැහැරවන්නට ඇත. එය ගැටළුවක් නො වෙයි. පසුකාලීන ව බිහිවන විචාරශීලී මෙන් ම නිර්මානශීලී ද වන බුද්ධිමතුනට ඒ නිවැරදි කරගත හැකි ය.

වියුක්ත ප්‍රවාද නිර්මානය නොකළ ද, ඉතාමත් නිර්මානශීලී බුද්ධිමතුන් සිටි පැරණි සිංහල සමාජය එක්තරා අවධියකින් පසු බුද්ධිමතුන් නිර්මානයකිරීම අත්හිටුවා ඇත. එය කෙසේ විණි දැයි නිශ්චිතව ම කිව නොහැකි නමුත් යම්කිසි ආකාරයක ආරක්ෂකවාදී ප්‍රතිපත්තියක් ද එයට හේතු වී ඇති බව පෙනෙයි. එක්තරා යුගයකින් පසු අපි ථෙරවාදයේ ආරක්ෂකයන් බවට පත්වීමු. ඉන්පසු ථෙරවාදයේ සජීවී මධ්‍යස්ථානය ලෙස පැවති අපේ රට ථෙරවාදයේ ආරක්ෂක මධ්‍යස්ථානය බවට පත්වී ඇත.

ශංකරාචාර්යවරයන්ගෙන් පසුව භාරතයෙන් බුදුසමය නැති වී යෑම එයට ප්‍රධාන හේතුවක් වන්නට ඇත. සමහරවිට ශංකරාචාර්යවරයන්ට පෙර සිට ම යම් ප්‍රමාණයකට ඒ තත්ත්වය භාරතයේ උදාවන්නට ඇත. සියවසකට හෝ එයට අධික කාලයක් තිස්සේ භාරතයේ විකාශය වූ යම් බෞද්ධ විරෝධී බ්‍රාහ්මණ ක්‍රියාදාමයක උච්ඡ ම අවස්ථාවක් ශංකරාචාර්යවරයන් විසින් පිලිබිඹු කෙරිණි යැයි සිතිය හැකි ය. මේ කාලය මුළුල්ලේ වෛදික බ්‍රාහ්මණ අභියෝගයට

මුහුණ දීගත නොහැකි ව එකල ථෙරවාදී මධ්‍යස්ථාන ලෙස තිබී යැයි සැලකිය හැකි ආන්ද්‍ර දේශය හා සිංහල දේශය එකතු වී ආරක්ෂකවාදී ප්‍රතිපත්තියක් සකස් කෙළේ යැයි ද අනුමාන කළ හැකි ය. ආන්ද්‍ර ප්‍රදේශයෙන් මෙරටට වැඩම කෙළේ යැයි කිවහැකි බුද්ධඝෝෂ හිමියන් මේ ප්‍රතිපත්තිය සකස්කිරීමේ ලා සම්බන්ධීකාරකයන් වහන්සේ මෙන් ම එහි ලා මුල් වූ භික්ෂූන් වහන්සේ නමක් ද වීමට ඇති ඉඩකඩ බොහෝ ය. උන්වහන්සේ මෙරටට වැඩම කර මාගධී ප්‍රාකෘතයෙන් හෝ එයට සමීප බසකින් හෝ එවකට දැනගෙන සිටි බුදු දහම ලිවීමට කටයුතු කළහ. එලෙස ග්‍රන්ථ ලියූ බස පසුකලෙක පෙළ (පාඨ) බස හෙවත් පාළි බස බවට පත්විය. පාළි බස යථාකාලයේ දී ථෙරවාදයේ නිල භාෂාව බවට පත්විය. එමෙන් ම එය උගතුන්ගේ බස බවට ද පත්විය.

බුදුදහම ආන්ද්‍ර ප්‍රදේශයෙන් ද නැති වී යනු දුටු මහාවිහාරවාසී සිංහල භික්ෂූන් වහන්සේ තව තවත් ආරක්ෂකවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළ බවට සැකයක් තිබිය නො හැකි ය. අභයගිරිවාසී භික්ෂූන්වහන්සේ ථෙරවාදය ආරක්ෂාකිරීම පිලිබඳ ව එතරම් සැලකිල්ලක් නොදැක්වීම ද මහාවිහාරවාසී භික්ෂූන්වහන්සේගේ කණස්සල්ලට හේතුවන්නට ඇත. සිංහලෙන් පොතපත තිබීම පවා තම ආරක්ෂකවාදී ප්‍රතිපත්තියට තර්ජනයක් බව මහාවිහාරයේ මතය වූ බව පෙනෙයි. එලෙස සිංහලෙන් පොතපත තිබීමෙන් සිංහල පමණක් දත් බුද්ධිමතුන් අතින් අළුත් කරුණු එකතු වී දහම විකෘතවිය හැකි යැයි මහාවිහාරවාසී භික්ෂූන්වහන්සේලා සිතන්නට ඇත. මේ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ ඉන්පසු නව නිර්මාන, නව අර්ථකථන බිහි නොවීමත් එවක පැවති අටුවා, ටීකා හා වෙනත් ග්‍රන්ථවලට අධිකාරිවාදී තත්ත්වයක් හිමිවීමත් ය. ඉන්පසු ඒ ග්‍රන්ථ ප්‍රශ්නකිරීමට මෙරට උගත්තු ඉදිරිපත් නො වූහ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva